# ටෙන්ඩර් ආකෘති පත්‍රය

## පල්ලේගම කුකුල් මස් කඩය, මාළු කඩ, රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම, පල්ලේගම බස්නැවතුම්පල ගාස්තු අයකිරීම, පල්ලේගම වැසිකිළි පද්ධතිය, නවනගර සතිපොළ සඳහා වෙළඳ අයිතිය බදු දීම

........................................................................................ 2013 වර්ෂයට බදුගැනීමේ අයදුම්පත

1. ටෙන්ඩර්කරුගේ නම -
2. ලිපිනය -
3. ටෙන්ඩර් නිකුත් කළ දිනය -
4. ටෙන්ඩර් තැන්පත් මුදල හා ලදුපත් අංකය -
5. පෝරම ගාස්තුව/ලදුපත් අංකය -
6. ජාතික හැඳුනුම්පත් අංකය හා දිනය -

................................................ ...................................................................

විෂය ලිපිකරුගේ අත්සන හා දිනය

ටෙන්ඩර් නිකුත් කරනු ලබන නිලධාරියාගේ අත්සන දිනය හා වේලාව

1. මෙහි පහත සඳහන් අත්සන් කරන ............................................................................................ පදිංචි ........................................................................................................ වන මම ඇඹිලිපිටිය නගර සභාවට අයත් ......................................................................................... 2013.01.01 - 2013.12.31 දක්වා අවුරුදු 01 ක කාලසීමාවකට රුපියල් ..........................................................................(අකුරෙන්) ........................................................(ඉලක්කමෙන්) බදුගැනීමට කැමැත්තෙමි.
2. මෙම බදු මුදලෙන් මාස තුනක වාරික මුදල හා ඊට එකතුකළ අගය මත බද්ද (12%) සහ ජාතිය ගොඩනැගීමේ බද්ද (2%) ආරක්ෂිත ඇප වශයෙන් ඇඹිලිපිටිය නගර සභාවේ කලින් තැන්පත් කර ගිවිසුම් අත්සන් කිරීමට එකඟ වෙමි.
3. වාර්ෂික බදු මුදල හා ඊට අිල එකතුකළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද සමාන කොටස් 12 කින් පිළිවෙළින් 2013 ජනවාරි මාසයෙන් පටන්ගෙන සෑම මසකම 10 දින හෝ ඊට පෙර ගෙවීමට එකඟ වෙමි.
4. ඒ තබන ආරක්ෂිත ඇප මුදල් ලබාගත හැක්කේ සියලු වාරික මුදල් ගෙවා නිම කිරීමෙන් පසුව බව හොඳාකාරවම දනිමි.
5. මෙහි 03 වන වගන්තියේ සඳහන් වාරික මුදල් නියමිත දින හෝ ඊට පෙර ගෙවීමට නොහැකි වුවහොත් ගෙවීම අතපසු වන සෑම සතියකටම හෝ ඉන් කොටසකට එකී වාරික මුදලින් 10% ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට එකඟ වෙමි.

6. මෙහි සතිපොළ පවත්වනු ලබන දිනට පසුදින පොළ භූමිය පවිත්‍ර කර පරිසර සෞඛ්‍යයට අහිතකර නොවන පරිදි පවත්වාගෙන යාමට එකඟ වෙමි.

7. වෙළඳපල හා කඩකාමර සම්බන්ධයෙන් දැනට පනවා ඇති සහ මතුවට පනවන්නා වූ අතුරු ව්‍යවස්ථා කඩ නොකරන බවත්, එකී අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කරන බවටත් එකඟ වෙමි.

8. ඉහත නම් සඳහන් ටෙන්ඩරකරු මා නම් මාගේ ටෙන්ඩරය පිළිගනු ලැබුවහොත් මවිසින් ටෙන්ඩර් කර ඇති මුදල නියම කරනු ලබන පරිදි ගෙවා එකී දේපලෙහි බදු අයිතිය ලබාගන්නා බවත්,

9. එසේ කිරීමට අපොහොසත් වුවහොත් මාගේ ටෙන්ඩර් තැන්පත් මුදල නගර සභාව සතුවන බව මා හොඳින් දන්නා බවත් ප්‍රකාශ කරමි.

10. අවම ලංසුවට අඩුවෙන් ඉදිරිපත් කරන සහ ප්‍රමාදව ඉදිරිපත් කරන ටෙන්ඩර් වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල නගර සභාවසතුවන බවත් මා හොඳාකාරව දනිමි.

11. මෙම මාළු කඩ, මස්කඩ නිතරම පවිත්‍ර කර පරිසර සෞඛ්‍යයට අහිතකර නොවන පරිදි පවත්වාගෙන යාමටත් එකඟ වෙමි.

.......................................................  .......................................................

දිනය  ඉල්ලුම්කරුගේ අත්සන

## ටෙන්ඩර් කොන්දේසි

1. ටෙන්ඩර්පත් භාරගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් පම❑.
2. බාලවයස්කාරයන් හෝ ඔවුන් වෙනුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් නොකළ යුතුයි.
3. ටෙන්ඩරයේ දිනට පෙර අවු.05 ක කාලසීමාව තුළදී පුරවැසි පනත, කිරුම් මිනුම් ආඥා පනත, මිල පාලන පනත, නගර සභා පනත සහ/හෝ ඇඹිලිපිටිය නගර සභාවට අයත් නවනගරය සතිපොළ සහ වෙළඳපල කඩකාමර සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවන් යටතේ වැරදිවලට වරදකරු කරන තැනැත්තන් සහ සභාව සතු ගොඩනැගිලි, කඩපිල් වෙළඳපිල් සහ වෙනත් ටෙන්ඩර්කරුවන් වෙනුවෙන් බදුමාසික කුලිය අධිගාස්තු හා වෙනත් ගෙවීම් නොගෙවූ තැනැත්තන්ද මෙම ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට නුසුදුස්සෝ වෙති.
4. 2012.11.06 දින ප.ව.3.00 දක්වා නියමිත ගාස්තු හා ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවා ටෙන්ඩර් ආකෘති පත්‍රය ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.
5. ටෙන්ඩරයේ මුල් පිටපත මෙන්ම එකී අනු පිටපත් ද වෙන් වෙන්ව කවර දෙකක බහා ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවූ බව දැක්වෙන නගර සභා කාර්යාලය මගින් නිකුත් කළ කුවිතාන්සිය ටෙන්ඩරයේ මුල් පිටපතට අමුණා අනතුරුව මුල් පිටපත හා අනු පිටපත එකම කවරයක බහා මුද්‍රා තබා "සභාපති ඇඹිලිපිටිය නගර සභාව ම යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය. එසේ නොඑවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. ටෙන්ඩරය බහාලූ කවරයේ වම්පස උඩ කෙළවරේ තමන් ඉල්ලුම් කරන විෂයෙහි නම සඳහන් කළ යුතුය.
7. කුකුල් මස් කඩය, මාළු කඩය සහ වැසිකිළි පද්ධති, රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම, බස්රථ පිවිසුම් ගාස්තු අයකිරීම සඳහා ටෙන්ඩර් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.
8. ටෙන්ඩර් සම්බන්ධයෙන් කළ යුතු සියළුම ගෙවීම් මුදලින් විය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.
9. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරු විසින් සකස් කරනු ලැබිය යුතු අතර ඔහු විසින් එහි අත්සන් තැබිය යුතුය.
10. ටෙන්ඩර් මුදල ආකෘතිපත්‍රයෙහි අකුරෙන් සඳහන් කර ඉලක්කමෙන්ද සඳහන් කළ යුතුය. වචනයෙන් කියවෙන මුදල සහ ඉලක්කමෙන් කියවෙන මුදල එකිනෙකට සමවිය යුතු අතර ආකෘතිපත්‍ර මුල් පිටපතේ මෙන්ම අනුපිටපතේද වෙනසක් නොමැතිව එය සටහන් විය යුතුය. වෙනස්කම් ඇති වුවහොත් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරනු ලැබේ.
11. ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි විමසා ඇති සියලුම තොරතුරු ටෙන්ඩර්කරු විසින් පැහැදිලි ලෙස තීන්තෙන් සටහන් කළ යුතුය.
12. 2012.11.07 දින පෙ.ව.10.00 ට හෝ ඊට පෙර ඇඹිලිපිටිය නගර සභාවේ සභාපති වෙත ලැබෙන සේ ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හා පුද්ගලිකව පැමිණ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.
13. ටෙන්ඩර් භාරගැනීම 2012.11.07 දින පෙ.ව.10.00 ට අවසන් වන අතර ඉන්පසු ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.2012.11.07 දින පෙ.ව.10.15 ට ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කිරීම සිදු කරනු ලැබේ. මේ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන් විසින් බලය පවරනු ලබන නියෝජිතයකුට පෙනී සිටිය හැක.
14. යම් ටෙන්ඩරයක් හෝ ඊට නියමිත ආකෘතිපත්‍ර නොඑවන්නේනම් හෝ මෙම කොන්දේසිවලට අනුකූල නොවන්නේනම් හෝ ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට කලින් ඉදිරිපත් නොකරන්නේනම්, එම ටෙන්ඩරය පිළිබඳව සලකා බලනු නොලැබේ. එසේම ටෙන්ඩර් ඇප මුදල්ද ආපසු ගෙවනු නොලැබේ.

15. යම් ටෙන්ඩරකරුවකුගේ කිසියම් ප්‍රකාශයක් අසත්‍යයයි හෙළි වුවහොත් එම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම හා නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම කළ හැක.

16. එක් පුද්ගලයකුට මස්කඩ/මාළු කඩ දෙකම සඳහා වුවද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පුළුවන.

17. වැඩිම ටෙන්ඩරය පිළිගැනීමට හෝ ටෙන්ඩර් අතුරින් කවර ටෙන්ඩරයක් හෝ කිසිම හේතුවක් නොදන්වා පිළිගැනීමට හෝ නැතහොත් ටෙන්ඩර් සියල්ල හෝ කිසිම ටෙන්ඩරයක් කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමට නගර සභාවට අයිතියක් ඇත. එසේ ගන්නා වූ තීරණය අවසාන තීරණය වන්නේය.

18. ටෙන්ඩරය පිළිගෙන ඇති බවට තමාට දැනුම් දෙන ලද විට එම සාර්ථක ටෙන්ඩරකරු එම ලිපියේ සඳහන් දින සිට දින 07 ක් ඇතුළත තමා ටෙන්ඩර් කර ඇති දේපල වෙනුවෙන් නියම කර ඇති වාර්ෂික කුලිය 12 ට බෙ වාරික එකකට එන මුදල මෙන් කොටස් 03 ක බදු මුදල්ද සමග ආරක්ෂිත ඇප මුදලක් ලෙස සභාවේ තැන්පත් කළ යුතු අතර නියමිත ගිවිසුමක් අත්සන් කළ යුතුය. මෙය ඉටුකිරීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර ටෙන්ඩර් ඇප මුදල් ආදිය සභාව සතු කරගනු ලැබේ.

19. ඉහත 18 වන කොන්දේසියෙහි සඳහන් ආරක්ෂිත ඇප මුදල් වශයෙන් තැන්පත් කරනු ලබන මුදල බදු කුලිය වශයෙන් නොසලකන අතර එම මුදල් ආපසු ගෙවනු ලබන්නේ ගිවිසුම්පතේ කොන්දේසි අනුව නියමිත පරිදි කාලසීමාව අවසන් වූ පසුවය.

20. සාර්ථක ටෙන්ඩර්කරු නියමිත ගිවිසුම්කරු ඇතුළත් වූ පසුව මෙම කොන්දේසිවලට අනුකූලව ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරුවන්ට තම ඇප මුදල් ලබාගැනීමට හැක.

21. මාසික බදු කුලිය අයවිය යුතු මාසයේ 10 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය. එසේ ගෙවීම ප්‍රමාද වන සතියකට හෝ ඉන් කොටසකට වුවද 10% (සියයට දහයක) දඩයක් ගෙවිය යුතුය.

22. අිල වෙළඳ ව්‍යාපාරය සඳහා හැර අන් කිසිදු කටයුත්තක් සඳහා ගොඩනැගිල්ල නගර සභාවේ ලිඛිත අවසරයක් නොමැතිව පාවිච්චි කිරීමට බදුකරුට නොහැකිය.

23. බදුකරු හෝ ඔහුගේ නියෝජිතයකු සේවකයකු විසින් සිතා මතා හෝ නොසැලකිලිමත්කම නිසා හෝ ගොඩනැගිල්ලට වෙළඳපිලට කිසියම් අලාභයක් සිදුවූ විටක ඊට වගකිව යුතු බදු ගැනුම්කරු නගර සභාවේ තක්සේරුව අනුව එම අලාභය ඉල්ලූ විට නගර සභාවට ගෙවිය යුතුය. මේ සම්බන්ධයෙන් නගර සභාවේ තීරණය අවසාන තීරණය වේ.

24. කාලසීමාව ගෙවී අවසාන වීමෙන් හෝ කාලසීමාව නියමිත දිනට කලින් අවසන් විය යුතුයයි ඇඹිලිපිටිය නගර සභාව තීරණය කිරීමෙන් හෝ බදු කාලය අවසන් වීමේදී බදුකරු තමාවෙත පවරා දී ඇති ගොඩනැගිල්ලෙන් හෝ වෙළඳපිලෙන් ඉවත්ව එකී භුක්තිය සාමකාමීව නගර සභාවට භාර දිය යුතු අතර. ඊට පටහැ❑ව කටයුතු කරන විටකදී නෙරපා හෝ ගොඩනැගිලි වෙළඳපල භාරගැනීමට නගර සභාවට අයිතිය ඇත්තේය. මේ සම්බන්ධයෙන් අලාභ හෝ වන්දි ලබාගැනීම සඳහා නගර සභාවෙන් හෝ ඔහුගේ නියෝග යටතේ ක්‍රියාකරනු ලබන නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමට නොහැක.

25. විදුලිය හෝ ජල සේවා ලබාගැනීමට අවශ්‍ය කඩකාමර ගොඩනැගිලි සඳහා සභාවෙන් ජලය සහ විදුලිය සපයන අතර ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව බිල්පත් පියවිය යුතුය.

26. අිල ව්‍යාපාරයන්ට බලපාන සියලුම ආඥා පනත් හා ඇඹිලිපිටිය නගර සභාව විසින් පනවා ඇති අතුරු ව්‍යවස්ථාවන් , නියමයන්, කොන්දේසිද පළාත් පාලන අමාත්‍යාංශයද, පළාත් පාලන කොමසාරිස්ද විටින් විට පනවනු ලබන නීතිරීති හා වෙනත් රජයේ නියමයන්ට අනුකූලව වන පරිදි ගැනුම්කරුවන් විසින් තම ව්‍යාපාරය පවත්වාගෙන යා යුතුය.

27. මස්කඩ/මාළුකඩ/වෙළඳපලේ පහත සඳහන් ව්‍යාපාරයන් කිරීමට ඉඩ නොදෙනු ලැබේ.

    1. පිසින ලද ආහාර

2. සෞඛ්‍යයට අහිතකර ආහාරපාන ආදිය

28. තවද සාර්ථක ටෙන්ඩර්කරුවන් තමන් හඳුනාගැනීම පි❑ස පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කළ හැඳුනුම්පත් මගින් හෝ වෙනත් පිළිගතහැකි සාක්ෂිවලින් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුය.

29. මෙම කොන්දේසිවලට අමතරව කලින් කලට අවශ්‍යයැයි හැගෙන වෙනත් සාධාරණ කොන්දේසි පැනවීමට ඇඹිලිපිටිය නගර සභාවට බලය තිබේ. ඒවාට එකඟ නොවන බදුකරුවන්ගේ බද්ද අවසාන කිරීමට හෝ බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීමට නගර සභාවට බලය තිබේ. කොන්දේසි උල්ලංඝනය කිරීම හේතුවෙන් බද්ද අවසන් කරනු ලැබූ කල්හි ඒ නිසා සිදුවිය හැකි කිසිදු අලාභහානියක් පිළිබඳව නගර සභාව සම්පූර්ණයෙන්ම නිදහස් විය යුතු බව දනිමි.

30. මෙහි සඳහන් ටෙන්ඩර් කොන්දේසිවලට බදුගැනුම්කරු ඇතුළත් විය යුතු ගිවිසුම් පත්‍රේම කොටසක් වන අතර, ටෙන්ඩර්කරු එය අත්සන් කර තම ටෙන්ඩර්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

31. මෙම කොන්දේසි මාලාවේ අංක 21 අනුව දඩ මුදල් අයකරනු ලැබුවද බදු මුදල් ගෙවීමේ ප්‍රමාදය එක් මසකට වඩා නොඉක්මවිය යුතු අතර, එක් මසකට වඩා ප්‍රමාද වීම ගිවිසුම අවලංගු කිරීමට හේතු විය හැක.

32. 2013 වර්ෂයේ සිට සතිපොළ නවනගරයේ ආර්ථික මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන අතර සභාව සතු සතිපොළ භූමියේ සංවර්ධන කටයුතු අවසන් වූ වහාම එම ස්ථානයේ සතිපොළ ස්ථානගත කරන බැවින් එකී දිනය දක්වා මෙම ටෙන්ඩරය වලංගු වන බවත් දැනගත යුතුය.

33. සතිපොළ පැවැත්වීමෙන් අනතුරුව වහාම පොළ භූමිය පිරිසිදු කර කසළ දැමීම සඳහා ස්ථානයක් ඔබට ඇත්නම් ඉවත් කරගන්නා ලෙසත්, එසේ නොමැතිනම් එකතුවන කසළ දිරන හා නොදිරන වශයෙන් වෙන්කොට සභාවේ කොම්පෝස්ට් අංගනයට භාර දිය යුතුය.

34. සභාව මගින් සතිපොළේ ප්‍රදර්ශනය කර ඇති මිල දර්ශනය අනුව පොළ බදුකරු බදු අයකළ යුතු අතර, එසේ නොමැතිව වැඩියෙන් බදු මුදල් අයකළහොත් බදුකරුගේ ගිවිසුම අවලංගු කර සතිපොළ සභාවට පවරා ගනු ලබන බව මා දනිමි.

35. වැසිකිළි පද්ධතිය බදුගන්නා අය විසින් වැසිකිළි පාවිච්චි කරනු ලබන එක් එක් පුද්ගලයාගෙන් රු.5.00 බැගින් අයකරගැනීමට අවසර දෙනු ලැබේ.

36. රථ වාහන වලින් බදු අය කිරිමේදී පහත සඳහන් මුදල් අය කල යුතුය.

20.1. බස්රථයක් හෝ ලොරි රථයක් සඳහා පළමු පැය 03 සඳහා රු.30 ක් හා අමතර පැයකට රු. 5 බැගින්
20.2 මෝටර් කාරයක් සඳහා පළමු පැය 03 සඳහා රු.20.00 ක් ද, අමතර පැයක් සඳහා රු.5.00 බැගින්ද
20.3 වෙනත් වාහන සඳහා (තී❑වීල් හැර) පළමු පැය 03 සඳහා රු.5.00 ක් සහ අමතර පැයකට රු. 1.00 බැගින්ද

37. ඇඹිලිපිටිය බස්නැවතුම්පල තුළ බස්රථ නවතා තැබීමේ ගාස්තු අයකිරීමේදී බස්රථයකින් රු.20.00 ක් බැගින් අයකිරීමට එකඟ වේ.

සභාපති,

ඇඹිලිපිටිය නගර සභාව

2012.11.24 දින

ඇඹිලිපිටිය නගර සභාවේදීය.

**සැ.යු.**

ඉහත සඳහන් කොන්දේසි යථාර්ථයෙන්ම ක්‍රියාවේ යොදවන හෙයින්ද සාර්ථක ටෙන්ඩර්කරුවන් එයට අනුකූලව ක්‍රියා කළ යුතු හෙයින්ද ටෙන්ඩර්කරුවන් තමතමන්ගේ ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට පෙර කොන්දේසි පිළිබඳව අවබෝධයක් ඇති කරගත යුතුය.

අංක 01 සිට 36 දක්වා කොන්දේසි කියවා තේරුම් කර දෙන ලදුව කියවා බලා තේරුම් ගත්තෙමි. එම කොන්දේසි මවිසින් බදුකරු වශයෙන් අත්සන් කළ යුතු ගිවිසුම් පත්‍රේම කොටසක් වශයෙන් පිළිගනිමි. මෙම කොන්දේසි හා ගිවිසුම් පත්‍රෙහි සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීමට එකඟ වෙමි.

......................................................

ටෙන්ඩර්කරුගේ අත්සන

නම –

ලිපිනය –

දිනය –